ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**මැයි 2019**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

2019 මැයි මාසයේදී නිෂ්පාදන ක්‍රියාකාරකම් යථා තත්වයට පත්වන ලදී. ඒ අනුව, 2019 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 9.7 ක් ඉහළ යමින්, දර්ශක අගය 50.7 ක් ලෙස වාර්තා කරන ලදී. විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි ක්‍රියාකාරකම් සහ නව ඇණවුම් වල සිදුවූ සැලකිය යුතු ඉහළ යාම, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම ඉහළ යාම කෙරෙහි කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය මාසයෙන් එකතු වූ ඇණවුම් සම්පූර්ණ කිරීම සඳහා කර්මාන්ත ශාලාවන්හි සිදුකරන ලද අමතර රාජකාරී හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාකාරකම් ඉහළ යන ලදී. අනපසු වූ ඇණවුම් සම්පූර්ණ කර ගැනීම සඳහා මැයි මාසය තුළදී සතියේ දින වල මෙන්ම සති අන්තයේද අමතර රාජකාරී කිරීමට සිදුවූ බව රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි බොහෝමයකගේ ප්‍රතිචාරය විය.

| විචලයය | අප්‍රේල් | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **41.0** | **50.7** | **+** | **පහළ යැමක සිට ඉහළ යැමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 37.5 | 52.0 | + | පහළ යැමක සිට ඉහළ යැමක් |
| නිෂ්පාදන | 32.5 | 55.0 | + | පහළ යැමක සිට ඉහළ යැමක් |
| සේවා නියුක්තිය | 43.5 | 45.0 | + | අඩු වේගයකින් පහළ යැමක් |
| ගැනුම් තොගය | 41.0 | 44.5 | + | අඩු වේගයකින් පහළ යැමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 55.5 | 52.5 | - | අඩු වේගයකින් ඉහළ යැමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවක බඳවා ගැනීම්වල දක්නට ලැබුණු සුළු පහළ යාම කෙරෙහි විශේෂයෙන්ම, ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ, සේවා නියුක්තියෙහි සැලකිය යුතු අඩු වීම හේතු විය. නව ඇණවුම් වල වර්ධනයක් දක්නට ලැබුනද, පෙර මාසයේ මිලදී ගත් අමුද්‍රව්‍ය තොග ඉතිරිව පැවතීම හේතුවෙන් මෙම කාල පරිච්ඡේදය තුළ මිලදී ගැනුම් පහළ යාමක් දක්නට ලැබුණි. පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු තර කරන ලද ආරක්ෂක විධිවිධාන හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි විය.


ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සේවා නියුක්තිය සහ ගැනුම් තොගය හැර අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කළ අතර, 2019 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2019 මැයි මාසයේදී නිෂ්පාදන ක්‍රියාකාරකම් ඉහළ ගිය බව ඉන් පෙන්නුම් කරයි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**50.7**

**2019 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 9.7 ක ඉහළ යාමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6 කින් ඉහළ යමින් 2019 මැයි මාසයේදී 49.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 මැයි මාසයේදී, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපා කලාපය, රුසියාව සහ සිංගප්පූරුව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවත්, ඉන්දියාව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කළ අතර චීනය නොවෙනස්ව පැවතුණි.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ජුනි 14 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

2019 මැයි මාසයේ දී පසුගිය මාසයට සාපේක්ෂව සේවා අංශයේ ක්‍රියාකාරකම් පහළ ගිය අතර පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සේවා නියුක්ති සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උපදර්ශකවල සිදු වූ පහළ යෑම ඊට හේතුවිය.

ප්‍රධාන වශයෙන්ම, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා, සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් පහළ යෑමත් සමග, කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කළ සේවකයන්ගේ සේවය අත්හිටුවීම හේතුවෙන් සේවා නියුක්ති උපදර්ශකය, 2015 මැයි මස ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය ඇරඹීමෙන් පසුව වාර්තා කළ අඩුම අගය වාර්තා කරන ලදී. තවද, තොග සහ සිල්ලර වෙළඳාම, සහ ප්‍රවාහන යන උපඅංශවල ද ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පහළ යෑමක් දක්නට ලැබුණි. ප්‍රතිචාර දක්වන්නන් රැසක් විසින් පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරය හේතුවෙන් රට තුළ ඇති වූ අස්ථායීතාව තවදුරටත් පවතින බව සඳහන් කර තිබුණි. ඒ අනුව, නව ව්‍යාපාර සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් පහළ යන ලදී.

| විචල්‍යය | අප්‍රේල් | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **45.3** | **44.7** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | <u>උප දර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 44.0 | 49.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 45.1 | 41.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.3 | 36.4 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.3 | 46.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 44.6 | 49.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| | | <u>අනෙකුත් දර්ශක</u> | | |
| අයකරන මිල ගණන් | 53.3 | 50.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ශ්‍රම පිරිවැය | 62.6 | 64.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා, සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශවලට අයත් හෝටල් සහ අනෙකුත් ආයතන මගින් ලබා දුන් වට්ටම් හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් 2019 මැයි මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය 2019 මැයි මාසයේ දී වැඩි වේගයකින් ඉහළ ගියේය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**44.7**

**2019 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6 ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි නිමැවුම් වර්ධන වේගයෙහි අඩු වීමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 අප්‍රේල් මාසයේ දී වාර්තා වූ 52.7 හි සිට මැයි මාසයේ දී මාස 33 කින් වාර්තා වූ පහළම අගය වන 51.6 දක්වා පහළ යන ලදී. කෙසේ වුවද, පසුගිය මාස 118 තුළ ගෝලීය සේවා නිමැවුමෙහි වර්ධනයක් එමගින් පෙන්නුම් කරයි.

ජපානය, චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 අප්‍රේල් මාසයට සාපේක්ෂව මැයි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ජූනි 13 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.